අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

පිරිවෙන් අධ්‍යාපන අංශය
பிரிவெனாக்கள் கல்வி பிரிவு
Division of Piriven Education

4 වන මහල, ඉසුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව / 4 வது மாடி, இசுருபாய, பத்தரமுல்ல, இலங்கை / 4th Floor,Isurupaya, Battaramulla, Sri Lanka
☎ +9411 278 5141 / +9411 278 4910 / +9411 278 4893 / +9411 278 4461 +9411 278 5617 / +9411 278 4992 info@piriven.gov.lk www.piriven.gov.lk

මගේ අංකය / எனது இல. / My Number } ED/ST/BUD/8/3/2/5/1

ඔබේ අංකය / உமது இல. / Your Number }

දිනය / திகதி / Date } 2022.07.16

සියලු ම කෘත්‍යාධිකාරී, පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා හා
බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන කෘත්‍යාධිකාරී/ ආයතනාධිපති සිල් මැණියන් වහන්සේලා වෙත.

## 2022 වර්ෂයේ දෙවන වාරය සඳහා පිරිවෙන් ආරම්භ කිරීම පිළිබඳ නිවේදනය

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2022.07.15 දාතමින් “2022.07.18 දින සිට 2022.07.20 දින දක්වා පාසල් නිවාඩු දීමට තීරණය කර ඇත” යන මැයෙන් නිකුත් කර ඇති මාධ්‍ය නිවේදනයේ සඳහන් කර ඇති පරිදි රජයේ පාසල් හා රජයේ අනුමත පෞද්ගලික පාසල් 2022.07.21 වෙනි බ්‍රහස්පතින්දා දින යලි ආරම්භ කිරීමට තීරණය කර ඇති බැවින් දිවයින පුරා පිහිටි සියලු ම පිරිවෙන් හා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන ද ඊට සමගාමී ව 2022.07.21 වෙනි දින 2022 වර්ෂයේ දෙවන වාරය සඳහා ආරම්භ කළ යුතු බව මෙයින් කාරුණික ව දන්වා සිටිමි.

02. කෙසේ නමුත් බහුතර සිසුන් පිරිසක් නේවාසික ව සිටින හා ගුරුවරුන් / සිසුන් සඳහා ප්‍රවාහන දුෂ්කරතා අවම පිරිවෙන් / බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන නියමිත පරිදි 2022.07.18 දින අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම සඳහා සුදුසු තීරණ ගැනීමේ බලය අදාළ පිරිවෙන්වල / බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනවල කෘත්‍යාධිකාරී හිමිවරුන්ට / සිල් මැණිවරුන්ට පැවරේ.

03. “පිරිවෙන් පළමු වාර පරීක්ෂණය - 2022” යන මැයෙන් මාගේ අංක ED/ST/BUD/8/2/2/1/1 හා 2022.06.17 දාතමින් යුත් ලිපියෙන් පළමු අධ්‍යයන වාරය නිමා වන 2022.07.08 දිනට පෙර එළඹෙන සතියේ 2022 වර්ෂයේ පළමු වාර විභාගය ලිඛිත ව හෝ වාචික ව පැවැත්විය යුතු බවට ලබා දෙන ලද උපදෙස් අනුව විභාගය පවත්වා නොමැති නම් 2022 වර්ෂයේ දෙවන වාරය සඳහා පිරිවෙන ආරම්භ කෙරෙන පළමු වන සතිය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බව ද තවදුරටත් කාරුණික ව දන්වා සිටිමි.

වර්නාපහ සෝමානන්ද හිමි,
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන ලේකම් වෙනුවට

**පිටපත් :**

01. අතිරේක ලේකම් (පාලන / සංවර්ධන) - පිරිවෙන් අධ්‍යාපන අංශය
02. සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
03. සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
04. සියලු ම අංශ හා පළාත් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන්
05. සියලු ම පිරිවෙන් කොට්ඨාස භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන්
06. සියලු ම විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන් හා මහත්වරුන්
07. සියලු ම පිරිවෙන් ගුරු උපදේශක මහත්වරුන් හා හිමිවරුන්

} කාරු. දැ.ගැ.පි / අ.ක.ස.

08. ගොනුවට